ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

මාධ්‍ය නිවේදන අංක 22/295

---

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකාව සමඟ විස්තීරණ අරමුදල් පහසුකමක් සැලසීම සඳහා එකඟතාවකට එළඹෙයි

**2022, සැප්තැම්බර් 1**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩල කණ්ඩායමක් විසින් කිසියම් රටක දූත මණ්ඩල කාර්යයක් අවසානයේ නිකුත් කෙරෙන පුවත්පත් නිවේදනයේ ඔවුන්ගේ මූලික නිරීක්ෂණයන් ඇතුළත් වේ. මෙම ප්‍රකාශනයේ සඳහන් වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්ය මණ්ඩලයේ මතය වන අතර, ඒය කිසිසේත්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලයේ මතය පිළිබිඹු නොකරයි. මෙම දූත මණ්ඩලයේ මූලික නිරීක්ෂණ මත පදනම් ව පිළියෙල කෙරෙන වාර්තාව ජා.මූ.අ. කළමනාකාරිත්වයේ අනුමැතියට යටත් වන අතර, සාකච්ඡාවට බඳුන් කොට තීරණයක් ගැනීම සඳහා එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක සභාව වෙත ඉදිරිපත් කෙරෙනු ඇත.

- ජා.මූ. අරමුදලෙහි කාර්ය මණ්ඩලය සහ ශ්‍රී ලංකා බලධාරීන් විසින් එ.ජ. ඩොලර් බිලියන 2.9ක පමණ විස්තීර්ණ ණය පහසුකම (https://www.imf.org/en/About/Factsheets/Sheets/2016/08/01/20/56/Extended-Fund-Facility ) (EFF) යටතේ මාස 48ක වැඩපිළිවෙලක් සමඟ ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්තිවලට සහය වීම සඳහා නිලධාරී මට්ටමේ එකඟතාවයකට එළඹී ඇත.

- *ශ්‍රී ලංකාවට ලබා දුන් නව ණය ආධාර වැඩසටහනේ අරමුණු වනුයේ, සාර්ව ආර්ථික ස්ථායීතාව සහ ණය තිරසාරභාවය ස්ථාපිත කරන අතර, මූල්‍ය ස්ථායීතාව ආරක්ෂා කිරීම, අවදානමට ලක්විය හැකි පුද්ගලයින් ආරක්ෂා කිරීම සහ වංචා හා දූෂණ සිදුවීමේ අවදානම් වැළැක්වීම හා ශ්‍රී ලංකාවේ වර්ධන විභවය ලඟා කර ගැනීම සඳහා වන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වේගවත් කිරීමයි.*

- *ණය තිරසාරභාවය සහතික කිරීමට සහ මූල්‍යන පරතරය පියවීම සඳහා ශ්‍රී ලංකාවේ ණය හිමියන්ගෙන් ණය සහන ලබා ගැනීම සහ බහුපාර්ශ්වික පාර්ශ්වකරුවන්ගෙන් අමතර මූල්‍යකරණයන් අවශ්‍ය වේ. ජා.මූ. අරමුදල විසින් ශ්‍රී ලංකාවට මූල්‍ය ආධාර සැපයීමට පෙර ශ්‍රී ලංකාවේ නිල ණය හිමියන්ගෙන් ණය තිරසාරභාවය ස්ථාපනය කිරීම සඳහා මූල්‍යකරණය*

*සහතික කර ගැනීමට සහ පෞද්ගලික ණය හිමියන් සමඟ සහයෝගිතා ගිවිසුමකට එළඹීමට සද්භාවයෙන් යුතුව ප්‍රයත්න දැරීම ඉතා වැදගත් වේ.*

**කොළඹ, ශ්‍රී ලංකාව - 2022 සැප්තැම්බර් 1 දින:** පීටර් බෲවර් (Peter Breuer) මහතා සහ මසහිරෝ නොසාකි (Masahiro Nozaki) මහතාගේ නායකත්වයෙන් යුතු ජා.මූ. අරමුදලේ දූත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට ජා.මූ. අරමුදලේ සහාය ලබා දීමට සහ බලධාරීන්ගේ පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන පිළිබඳ සාකච්ඡා අඛණ්ඩව සිදු කිරීමට 2022 වසරේ අගෝස්තු 24 සිට සැප්තැම්බර් 1 දක්වා කාලය තුළ කොළඹට පැමිණියේය.

දූත මණ්ඩල සංචාරය අවසානයේදී බෲවර් සහ නොසාකි යන මහත්වරුන් විසින් පහත සඳහන් ප්‍රකාශය නිකුත් කරන ලදී.

“විශේෂ ගැනුම් හිමිකම් බිලියන 2.2ක පමණ (එ.ජ. ඩොලර් බිලියන 2.9කට සමාන) සඳහා වන ප්‍රවේශයක් සහිත මාස 48ක නව විස්තීර්ණ ණය පහසුකමක් සමඟ බලධාරීන්ගේ ආර්ථික ගැළපුම් සහ ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිවලට සහාය වීමට ශ්‍රී ලංකා බලධාරීන් සහ ජා.මූ. අරමුදලේ කණ්ඩායම නිලධාරී මට්ටමේ එකඟතාවයකට පැමිණ ඇත.

“දූෂණ සිදුවීමේ අවදානම් අවම කරමින් සහ ශ්‍රී ලංකාවේ වර්ධන විභවතා ඇති කරමින් නව විස්තීර්ණ ණය පහසුකම මඟින් සාර්ව ආර්ථික ස්ථායීතාව සහ ණය තිරසාරභාවය ස්ථාපිත කිරීමේ ශ්‍රී ලංකාවේ වැඩසටහනට සහාය වනු ඇත. බලධාරීන් විසින් පූර්ව ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකාවේ නිල ණය හිමියන්ගෙන් මූල්‍යකරණ සහතික කර ගැනීම සහ පෞද්ගලික ණය හිමියන් සමඟ සහයෝගීතා ගිවිසුමකට එළඹීමට සද්භාවයෙන් යුතුව ප්‍රයත්න දැරීම මත මෙම ගිවිසුම සඳහා ඉදිරි කාලසීමාව තුළ ජා.මූ. අරමුදලේ කළමනාකාරිත්වයේ සහ විධායක මණ්ඩලයේ අනුමැතිය ලැබීම රඳා පවතී. ණය තිරසාරභාවය සහතික කිරීමට සහ මූල්‍යන පරතරය පියවීමට ශ්‍රී ලංකාවේ ණය හිමියන්ගෙන් ණය සහන සහ බහුපාර්ශ්වික හවුල්කරුවන්ගෙන් අතිරේක මූල්‍යකරණය ලබා ගැනීම අවශ්‍ය වේ.

“ශ්‍රී ලංකාව උග්‍ර අර්බුදයකට මුහුණ දී සිටී. බාහිර කම්පනවලට ඔරොත්තු දීමට ඇති ආරක්ෂණ ප්‍රමාණවත් නොවීම සහ තිරසාර නොවන රාජ්‍ය ණය තත්ත්වය හේතුවෙන් අවදානම් වර්ධනය වී ඇත. අප්‍රේල් මාසයේ දී විදේශ ණය ආපසු ගෙවීම තාවකාලිකව නැවැත්වීමත් සමඟ ශ්‍රී ලංකාව තම විදේශීය වගකීම් පියවීම කල් දැමූ අතර, තීරණාත්මක ලෙස අඩු මට්ටමක පවතින විදේශ සංචිත ඉන්ධන ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනයට බාධාවක් වීම මඟින් ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් අඩාල කළේය. 2022 වසරේදී ආර්ථිකය සියයට 8.7කින් සංකෝචනය

වනු ඇතැයි අපේක්ෂා කරන අතර උද්ධමනය මෑතකදී සියයට 60ක් ඉක්මවිය. මෙහි බලපෑම අසමානුපාතික ලෙස දිළිඳු සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයින් විසින් දරනු ඇත.

"මෙම පසුබිම හමුවේ වුවද, අරමුදලේ සහාය ඇතිව, බලධාරීන් විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන මඟින් ආර්ථිකය ස්ථාවර කිරීම, ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවනෝපාය ආරක්ෂා කිරීම, ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සඳහා පසුබිම සකස් කිරීම සහ තිරසාර සහ ආර්ථිකයේ සෑම අංශයකටම ප්‍රතිලාභ ලැබෙන ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම අරමුණු කරයි.

"වැඩසටහනෙහි මූලික අංග වනුයේ:

• රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයට සහාය වීම සඳහා රාජ්‍ය මූල්‍ය ආදායම ඉහළ නැංවීම. මෙම වැඩසටහන මගින්, ලෝකයේ දැනට පවතින අඩුම රාජ්‍ය ආදායම් මට්ටම්වලින් එකකින් ආරම්භ වෙමින්, ප්‍රධාන බදු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරනු ඇත. මෙම ප්‍රතිසංස්කරණවලට, පුද්ගල ආදායම් බද්ද ආදායම් මට්ටමට අනුව වඩාත් අනුක්‍රමික කිරීම සහ ආයතනික ආදායම් බදු සහ එකතු කළ අගය මත බදු සඳහා බදු පදනම පුළුල් කිරීම ඇතුළත් වේ. 2025 වසර වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ක ප්‍රාථමික අතිරික්තයක් ළඟා කර ගැනීම වැඩසටහනේ අරමුණයි.

• රජය සතු වාණිජ ව්‍යවසායයන් මඟින් ඇති වන රාජ්‍ය මූල්‍ය අවදානම් අවම කිරීම සඳහා ඉන්ධන සහ විදුලිය සඳහා පිරිවැය ආවරණය කිරීම පදනම් කරගත් මිල ක්‍රමයක් හඳුන්වා දීම. බලධාරීන් විසින් දැනටමත් ප්‍රකාශයට පත් කරන ලද ආදායම් සම්බන්ධයෙන් ගෙන ඇති සැලකිය යුතු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ බලශක්ති මිල ප්‍රතිසංස්කරණ පිළිබඳව කාර්ය මණ්ඩලය සෑහීමකට පත්ව ඇත.

• දුප්පතුන්ට සහ අවදානමට ලක්විය හැකි ජනතාවට වත්මන් අර්බුදයේ බලපෑම අවම කිරීම සඳහා සමාජ වියදම් ඉහළ නැංවීමෙන් සහ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වල ආවරණය සහ ප්‍රතිලාභීන් ඉලක්ක කිරීම වැඩිදියුණු කිරීම.

• මිල ස්ථායීතාව නැවත ඇති කිරීම සඳහා දත්ත මත පදනම් වූ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව, රාජ්‍ය අයවැය මූල්‍යනය කිරීම ක්‍රමානුකූලව ඉවත් කිරීම සහ නම්‍යශීලී

උද්ධමනය ඉලක්ක කරගත් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ඉඩ සලසන මහ බැංකුවේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම. නව මහ බැංකු පනත මෙම උපාය මාර්ගයේ මූලික අංගයකි;

• වැඩසටහන යටතේ ඇති පුළුල් ප්‍රතිපත්ති පැකේජය මගින් සහය දක්වන වෙළෙඳපොළ මඟින් තීරණය කරනු ලබන සහ නම්‍යශීලී විනිමය අනුපාතිකයක් ප්‍රතිෂ්ඨාපනය කිරීම හරහා විදේශීය සංචිත නැවත ගොඩ නැංවීම;

• ශක්තිමත් සහ ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය වූ බැංකු පද්ධතියක් සහතික කිරීම සහ සංශෝධිත බැංකු පනතක් මඟින් මූල්‍ය අංශයේ ආරක්ෂිත ජාල සහ නියාමන ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම මඟින් මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීම; සහ

• ජා.මූ. අරමුදලේ තාක්ෂණික සහාය ඇතිව මූල්‍ය විනිවිදභාවය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම, ශක්තිමත් වංචා හා දූෂණ විරෝධී නෛතික රාමුවක් හඳුන්වාදීම සහ සවිස්තරාත්මක පාලන විශ්ලේෂණයක් සිදු කිරීම තුළින් දූෂණ සිදුවිය හැකි අවදානම් අවම කිරීම.

"ජා.මූ. අරමුදලේ කණ්ඩායම, ජනාධිපති සහ මුදල් අමාත්‍ය රනිල් වික්‍රමසිංහ, අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ, භාණ්ඩාගාර ලේකම් කේ.එම්. මහින්ද සිරිවර්ධන සහ අනෙකුත් රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීය. ඔවුන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පෞද්ගලික අංශයේ නියෝජිතයින්, සිවිල් සමාජ සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන්ව ද හමු විය.

"බලධාරීන්ගේ අවංක ප්‍රවේශය සහ උණුසුම් ආගන්තුක සත්කාරය පිළිබඳව බලධාරීන්ට ස්තූති කරන අතර ශ්‍රී ලංකාවට සහ එහි ජනතාවට සහය දැක්වීම සඳහා අපගේ සහයෝගය අඛණ්ඩව ලබා දීමට බලාපොරොත්තු වෙමු."

**මූලාශ්‍ර:**

**ජා.මූ.අ. ශ්‍රී ලංකා වෙබ් පිටුව** https://www.imf.org/en/Countries/LKA

**ජා.මූ.අ. ශ්‍රී ලංකා කාර්යාලයේ වෙබ් පිටුව**
https://www.imf.org/en/Countries/ResRep/LKA

ජා.මූ.අ. ණය පිළිබඳ වෙබ් පිටුව https://www.imf.org/en/About/Factsheets/IMF-Lending

**මාධ්‍ය සබඳතා**

**මාධ්‍ය නිලධාරී:** ටින් යන්

**දු.ක.** +1 202 623-7100 **විද්‍යුත් තැපෑල:** **MEDIA@IMF.ORG**

**ට්විටර්** **https://twitter.com/IMFSpokesperson**